<u>**කාර්ය පත්‍රිකාව**</u>

නිපුණතාව 2.0 **නාට්‍ය හා රංග කලාව විෂය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.**

නිපුණතා මට්ටම 2.1 **නාට්‍ය හා රංග කලාව යන්න විමසයි.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නාට්‍ය හා රංග කලාව යන දෙපදය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ ,
    i. නාට්‍ය යන්නෙන් පෙළ නිර්මාණ හා ඊට සම්බන්ධ මූලධර්ම හා සිද්ධාන්ත අර්ථවත් වේ.
    ii. රංග කලාව යන්නෙන් වේදිකාව මත රංගනය අරමුණු කොටගත් සියළු අංගයන්ය.
    iii. මෙම පද දෙක මඟින් ප්‍රායෝගික හා න්‍යායාත්මක වපසරියක් පෙන්නුම් කරයි.
    iv. පද දෙකේ සංකලනයෙන් එකිනෙකට බද්ධ නොවී නාට්‍ය නිර්මාණය බිහි වේ.
    v. නාට්‍ය යන්නෙන් පොදුවේ පෙළක් රූපවාහිනී , ගුවන් විදුලියට ගැලපෙන ආකාරයෙන් ඉදිරිපත් කිරීමත්ය.
02. රංග කලාවෙහි ප්‍රධාන අංගය වූ නිෂ්පාදන ක්‍රියාවලියේ මූලික වගකීම දරණ පුද්ගලයා වන්නේ ,
    i. නිෂ්පාදන iii. අර්ථපති v. පෙළ මතක්කරන්නා
    ii. අධ්‍යක්ෂක iv. වේදිකා පරිපාලන
03. නාට්‍ය පෙළක මූලිකාංග හා සම්බන්ධ වඩාත් නිවැරදි කාණ්ඩය වන්නේ ,
    i. තේමාව , සතර අභිනය , රංග විධාන , සංවාද iv. තේමාව , ගැටුම , රූපණය , සංවාද
    ii. ගැටුම , තේමාව , රංග විධාන , සංවාද v. නාට්‍ය උත්ප්‍රාසය , ආනුශංගික අංග , රංග විධාන , සංවාද
    iii. චරිත , ගැටුම , රංග විධාන , සමාරෝපය
04. රංග කලාවට අයත් මූලිකාංගයක් නොවන්නේ ,
    i. සතර අභිනය iii. ආනුශාංගික අංග v. කතාවස්තුව
    ii. රංග වින්‍යාසය iv. තාක්ෂණ උපක්‍රම
05. නළු නිළි රංග කාර්යය සඳහා දායක වන කලාව වන්නේ ,
    i. සමාරෝපය iv. ආනුශාංගික අංග v. අනුකරණය
    ii. සතර අභිනය
    iii. රූපනය

- **කෙටි පිළිතුරු සපයන්න.**

06. නාට්‍ය හා රංග කලා විෂය හැදෑරීමේදී නාට්‍ය යන සංකල්පයට අයත් විෂය කොටස් නම් කරන්න.

07. රංග කලාව යන සංකල්පයට අයත් විෂය කොටස් නම් කරන්න.

08. නාට්‍ය පිටපතක දැකිය හැකි ලක්ෂණ දක්වන්න.

09. ආනුෂංගික කලා කීයද ? ඒවා නම් කරන්න.

10. නාට්‍ය කලාව හැර සෙසු ප්‍රාසංගික කලා නම් කරන්න.

- **රචනා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

11. රංග ශෛලීය හා විචාරය වැනි සංකල්ප නාට්‍ය මූලධර්ම කොටසට මෙන්ම රංග කලාව යන ප්‍රායෝගික කොටස සමඟ ද එකිනෙකට සම්බන්ධ වේ. යන කියමන පැහැදිළි කරන්න.

12. නාට්‍ය හා රංග කලා යන සංකල්ප දෙක මනාව සුසංයෝජනය කිරීම මඟින් නාට්‍ය නිර්මාණයන් බිහිවන අයුරු ඔබ දුටු නාට්‍යයක් ඇසුරු කොටගෙන පැහැදිළි කරන්න.
13. ඔපෙරා , බැලේ , මුද්‍ර යන කලාවන් නාට්‍ය මූලධර්ම අනුව සකස් වී ඇති ආකාරය කෙසේදැයි පැහැදිළි කරන්න.

14. රංග කලාවට ප්‍රේක්ෂක සහභාගිත්වයේ ඇති වටිනාකම අගයන්න.